# 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනත

[අනුමතය ලැබූ දිනය: 1972 මාර්තු 18]

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තිය ප්‍රකාර අධිකරණ අමාත්‍යවරයාගේ
අධිකාරය යටතේ පළ කරන ලදී

(1973 මාර්තු මස ... වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ
අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ:                                                    තැපැල් ගාස්තුව:

# 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනත

එල්. ඩී.—ඕ. 29/71.

සමූපකාර සේවක කොමිෂන් සභාව යනුවෙන් හැඳින්විය යුතු කොමිෂන් සභාවක් පිහිටුවා නීතියත කිරීම පිණිස ද සමූපකාර සමිතිවල සේවකයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

[අනුමතය ලැබූ දිනය : 1972 මාර්තු 18].

වර්තමාන පාර්ලිමේන්තුවව රැස් වූ ලංකාවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමතිය අනුව හා ඇතිව, එහි ම බලය ප්‍රකාර, අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මේ පනතෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*මේ පනතේ මතුවට එන විධිවිධානවලින් සමූපකාර සමිති නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු බලය.*

2. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින්,—

(අ) එහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් සමූපකාර සමිති පන්තියක් ; හෝ

(ආ) එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් සමූපකාර සමිතියක්

මේ පනතේ මතුවට එන විධිවිධානවලින් නිදහස් කළ හැකි අතර, ඒ අනුව, "සමූපකාර සමිතිය" යන යෙදුම ඒ විධිවිධානවල යෙදෙන කවර ස්ථානයක වුව ද එබඳු ආඥාවක් තත් කාලයෙහි වලංගුව තිබෙන කාලය තුළ සමූපකාර සමිතියක් එයින් අදහස් වන ලෙස කියවා තේරුම් ගත යුතු ය.

## I වන කොටස

### සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම, එහි බලතල හා කාර්යයන්

*සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම.*

3. මේ පනතේ කාර්යයන් සඳහා සමූපකාර සේවක කොමිෂන් සභාව යනුවෙන් සඳහන් කරනු ලබන හා හැඳින්වෙන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

*කොමිෂන් සභාවේ සංයුතිය*

4. (1) මේ වගන්තියේ මතුවට එන විධිවිධාන අනුව කොමිෂන් සභාව සංයුක්ත විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතු ය.

(3) යම් තැනැත්තෙක්—

(අ) සමුපකාර සමිතියක සේවකයකු හෝ හිටපු සේවකයකු නම්; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව, සමුපකාර සමිති විසින් සේවයෙහි යොදවා ගනු ලබන යම් වර්ගයකට අයත් තැනැත්තන්ගේ වැටුප්, වේතන හෝ සේවා කොන්දේසි සකස් කිරීම අරමුණු වශයෙන් ඇති හෝ අරමුණුවලින් එකක්ව ඇති යම් කාර්ය මණ්ඩලික සංගමයක හෝ වෘත්තීය සමිතියක සාමාජිකයකුව සිටින තැනැත්තකු නම්; හෝ

(ඇ) සමුපකාර සමිති පිළිබඳ නීතිය අනුව සමුපකාර සමිතියක නිලධරයකුව සිටින තැනැත්තකු නම්; හෝ

(ඈ) තත් කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිටින තැනැත්තකු නම්

ඒ තැනැත්තා ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීම සඳහා නුසුදුසු විය යුතු ය.

කොමිෂන් සභාව නීතිගත කිරීම.

5. කොමිෂන් සභාව අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත කරන ලද මණ්ඩලයක් විය යුතු අතර එහි නීතිගත තත්ත්වයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි විය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

6. කොමිෂන් සභාවේ එක් එක් සාමාජිකයා තම පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද එවැනි පත්වීමක ධුර කාලය නොතකා—

(අ) එකී සාමාජිකයකු විසින් යම් අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කිරීම හෝ කළ හැකි ය; තව ද

(ආ) එකී යම් සාමාජිකයකු 4(3) වන වගන්තිය අනුව නුසුදුසු වීමෙන් පසු ඒ හේතුවෙන්ම සිය ධුරය හිස් කළ යුතු ය:

එසේම තවදුරටත් එකී යම් සාමාජිකයකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ධුරය හිස් කිරීමෙන් හෝ ඇති වන යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු ධුරය කලින් හිස් කරන්නේ නම් මිස, ඔහු පත් කරනු ලැබුවේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කොටසට සමාන කාලයක් මුත් ඊට වැඩි කාලයක් ඔහු විසින් ඒ ධුරය නොදැරිය යුතු ය.

සභාපති, හා, කටයුතු කරගෙන යාම.

7. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් ගෙන් කෙනකු එහි සභාපති වශයෙන් පත් කළ යුතු ය. සභාපති පැමිණ සිටිනු කොමිෂන් සභාවේ සියලුම රැස්වීම්වල දී මූලාසනය දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපති පැමිණ නො මැති විට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබනු යම් සාමාජිකයකු විසින් එහි මූලාසනය දැරිය හැකි ය.

(2) කොමිෂන් සභාවේ රැස්වීමකට ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකු විය යුතු ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සාමාජිකයන් දෙදෙනකු පමණක් පැමිණ සිටියහොත් හා යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කළ යුතු තීරණය පිළිබඳව ඒ සාමාජිකයන් අතර මතය වෙනස් වුව හොත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන් දෙනාම පැමිණ සිටින රැස්වීමක් වෙත යොමු කළ යුතු ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන් දෙනාම පැමිණ සිටින යම් රැස්වීමක දී යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දිය යුතු තීරණය පිළිබඳව කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර මතය වෙනස් වුව හොත් ඒ ප්‍රශ්නය පැමිණ සිටින සාමාජිකයන් වැඩි දෙනාගේ මතය අනුව තීරණය කළ යුතු ය. එහෙත් සාමාජිකයන් සමානව බෙදුණ හොත් සභාපතිට තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(5) මේ පනතෙහි හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කළ හැකි ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයන්ගෙන් යමකු පත් කිරීමේ යම් දොසක් තිබීමේ හේතුවෙන් පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් අවලංගු නොවිය යුතු ය.

8. කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට මුදල් අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් හා දීමනා ගෙවිය යුතු ය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

9. (1) කොමිෂන් සභාවේ ලේකම්වරයකු විය යුතු අතර ඔහු ලංකා පරිපාලන සේවයේ නිලධරයකු විය යුතු ය. ලේකම් හා සෙසු නිලධරයෝ.

(2) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙහි සෙසු සාමාජිකයන් ආණ්ඩුවේ මාරුවීම් සහිත සේවාවන්ගෙන් පත් කරනු ලැබිය යුතු ය.

10. (1) කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේ දී මේ පනතේ උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියෙහි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් හෝ දිය යුතු ය. කොමිෂන් සභාවේ සාමාජිකයන් හා නිලධරයන් විසින් දිවුරුම දීම.

(2) කොමිෂන් සභාවේ ලේකම් විසින් හා දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් හෝ දිය යුතු යයි කොමිෂන් සභාවේ සභාපති විසින් නියම කළ හැකි කොමිෂන් සභාවේ සෙසු නිලධරයන් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේ දී මේ පනතේ උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියෙහි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් හෝ දිය යුතු ය.

11. (1) කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතු ය:— කොමිෂන් සභාවේ බලතල.

(අ) සමූපකාර සමිතිවල සේවකයන් බඳවා ගැනීමේ ක්‍රමවලට අදාළ සියලු කරුණු හා ඔවුන්ගේ සේවා කොන්දේසි ද පත් කිරීම් කිරීමේ දී හා සමූපකාර සමිතියක එක්

තනතුරකින් ඒ සමිතියේ ම තවත් තනතුරකට උසස් කිරීම් දීමේ දී ඒ සමිති විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම;

(ආ) සමුපකාර සමිතිවල සේවකයන් වශයෙන් බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම හෝ ඒ විභාග පැවැත්වීමේ කාර්යය සඳහා පරීක්ෂක මණ්ඩල පත් කිරීම හා විභාගවලට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් ගාස්තු අය කිරීම;

(ඇ) කොමසාරිස් විමසා එවැනි යම් තනතුරකට පත් කිරීම් සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම, යම් පන්තියක හෝ වර්ගයක එවැනි යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළ යුතු වැටුප් ක්‍රම නියම කිරීම, ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම හෝ සකස් කිරීම හා සමුපකාර සේවකයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි නිශ්චය කිරීමෙහි දී කොමිෂන් සභාවට සහායවීම පිණිස කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සැලකිය හැකි උපදේශක කාර්ය සංවිධාන පිහිටුවීම;

(ඈ) යම් පන්තියක හෝ වර්ගයක යම් තනතුරක් හෝ තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් නියම කරන ලද වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙස සමුපකාර සමිතිවලට නියම කිරීම;

(ඉ) තම සේවකයන්ට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීමේ අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීමෙහි ලා යම් සමුපකාර සමිතියක් විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ කාර්ය පටිපාටි නිශ්චය කිරීම, සේවකයන්ට විරුද්ධ විනයානුකූල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත දී අවසාන කරන ලෙස යම් සමුපකාර සමිතියකට නියම කිරීම හා යම් සමුපකාර සමිතියක් විසින් කරනු ලැබූ විනයානුකූල නියෝගයකට විරුද්ධව පැන නගින අභියාචනා විභාග කිරීම;

(ඊ) යම් සමුපකාර සමිතියක සේවකයන්ට අදාළ නියමිත සටහන් තබන ලෙස ඒ සමිතියට නියම කිරීම;

(උ) යම් සමුපකාර සමිතියක යම් සේවකයකු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි ලිපිගොනු, වෙනත් ලේඛන හෝ තොරතුරු නිශ්චිතව නියමිත දිනයකට පෙර සපයන ලෙස ඒ සමිතියට නියම කිරීම;

(ඌ) කොමිෂන් සභාව විසින් යොමු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පිණිස නිලධරයන්ගෙන් සමන්විත මූලමණ්ඩලයක් හෝ මූලමණ්ඩල පත් කිරීම;

(එ) යම් සමුපකාර සමිතියක සේවකයකුගේ ක්‍රියාකලාපය පරීක්ෂණයකට විෂය වී තිබී ඒ සේවකයා විසින් සමිතියේ තීරණයට විරුද්ධව කොමිෂන් සභාව වෙත අභියාචනා කර ඇති අවස්ථාවක, ඔහු නැවත සේවයට ගැනීම පිළිබඳ

උපදෙස් ඇතුළුව ඒ සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි උපදෙස් ක්‍රියාත්මක කරන ලෙස ඒ සමූපකාර සමිතියට නියම කිරීම;

(ඒ) සේවකයන්ගේ සේවය අවසන් වීමේ දී පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ට යම් ප්‍රදාන කළ හැක්කේ යම් සාමාන්‍ය ප්‍රතිපත්ති අනුව ද ඒ ප්‍රතිපත්ති නිශ්චය කිරීම;

(ඔ) මේ පනත ක්‍රියාත්මක වීමෙන් යම් සමූපකාර සමිතියක් හෝ යම් පන්තියක සමූපකාර සමිති නිදහස් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් විමසා අමාත්‍යවරයාට උපදෙස් දීම; හා

(ක) අමාත්‍යවරයා විසින් සාදා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය හැකි, සමූපකාර සමිතිවලට හා ඒවායේ සේවකයන්ට අදාළ වෙනත් බලතල ක්‍රියාවෙහි යෙදවීම.

(2) (1) වන උපවගන්තියෙන් කොමිෂන් සභාව වෙත පැවරුණු බලතල ක්‍රියාවෙහි යෙදවීමේ දී, කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ හෝ නිශ්චය කිරීම් වෙනස් කිරීම, අලුතු කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කොමිෂන් සභාව විසින් කළ හැකි ය.

12. කොමිෂන් සභාවේ වියදම් වාර්ෂික විසර්ජන පනත යටතේ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා ප්‍රතිපාදනය කරනු ලබන මුදල් වලින් ගෙවිය යුතු ය. මුදල් විධිවිධාන.

## II වන කොටස

### සමූපකාර සමිති හා ඒවායේ සේවකයෝ

13. යම් සේවකයකුගේ වැටුප හා වෙනත් පඩිනඩි සමිතියේ මුදල්වලින් තත් කාලයෙහි ගෙවන සමූපකාර සමිතියක් ඒ සේවකයාගේ සේවායෝජකයා ලෙස සලකනු ලැබිය යුතු ය. සමූපකාර සමිතියක් සේවා යෝජකයකු විය යුතු බව.

14. සමූපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයකු වුව ද මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි විධානවලට යටත් විය යුතු අතර, මේ පනත යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා බලතල ඉටු කිරීමෙහි හා ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා කෙරෙන කොමිෂන් සභාවේ සියලු තීරණ 11 (2) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව අවසානාත්මක විය යුතුවත් හැර අමාත්‍යවරයා විසින් 2 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් මේ පනත ක්‍රියාත්මක වීමෙන් නිදහස් නො කරන ලද සියලු සමූපකාර සමිති හා ඒවායේ සේවකයන් ඒ විධාන පිළිපැදීමට බැඳී සිටිය යුතු ය. සමූපකාර සමිති හා ඒවායේ සේවකයන් කොමිෂන් සභාවේ විධානවලට යටත් විය යුතු බව.

15. යම් සමූපකාර සමිතියක යම් සේවකයකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියලු විධාන 11 (2) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව අවසානාත්මක විය යුතු අතර ඒ විධාන ඒ සමිතිය විසින් කරන ලද්දක් මෙන් ඒ සේවකයා ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතු ය. කොමිෂන් සභාවේ විධානවලින් සමූපකාර සමිතිවල සේවකයන් බැඳෙන බව.

(අ) (ලු)

සේවා නියමයන් හා කොන්දේසි ඇති කිරීම හා ඒවා පිළිගැනීමට තෝරා ගැනීම.

16. (1) කොමිෂන් සභාව විසින් ඇති කරනු ලබන ප්‍රථම සේවා නියමයන් හෝ කොන්දේසි නියමිත දිනයෙහි සිට, හෝ ඇති කරනු ලබන ප්‍රථම වැටුප් ක්‍රම සම්බන්ධයෙන් වූ විට කොමිෂන් සභාව විසින් නියම කළ හැකි යම් පසු දිනයක හෝ දිනවල සිට, ක්‍රියාත්මක විය යුතු ය.

(2) 1970 සැප්තැම්බර් මස 2 වන දිනයට පෙර සේවයෙහි යොදවා ගන්නා ලද සෑම සේවකයකුට ම, ඔහු කැමැත්තේ නම්, ඒ දිනයට පෙරාතුව ම ඔහුට අදාළව තුබූ සේවා නියමයන් හා කොන්දේසි පිට සේවයෙහි රැඳී සිටීමට තෝරා ගැනීමට ඉඩ දිය යුතු ය.

(3) නියමිත දිනයට පෙරාතුව ම තමාට අදාළ වූ සේවා නියමයන් හා කොන්දේසි පිට සේවයෙහි රැඳී සිටීමට තෝරා ගන්නා යම් සේවකයකු විසින් නියමිත දිනයෙන් පසු දින හැටක් ඇතුළත ඒ තෝරා ගැනීම ඔහු සේවයෙහි නියුක්ත සමුපකාර සමිතිය වෙත ලියවිල්ලකින් දැන්විය යුතු අතර ඒ කාලසීමාව ඇතුළත ඒ දැන්වීම කිරීමට අපොහොසත් වන සේවකයකු කොමිෂන් සභාව විසින් නියම කරන ලද සේවා නියමයන් හා කොන්දේසි පිළිගත් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) නියමිත දිනයට පෙරාතු ව තමාට අදාළ වූ සේවා නියමයන් හා කොන්දේසි පිට සේවයෙහි රැඳී සිටීමට තෝරා ගන්නා යම් සේවකයකු නියමිත දිනයට පසු යම් විටෙක දී ඔහු වෙත පිරිනැමුණු උසස් කිරීමක් පිළිගත හොත් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිළිගැනීමට ඔහුට නියම කළ යුතු ය.

(5) නියමිත දිනයෙහි හෝ ඊට පසු යම් සමුපකාර සමිතියක තනතුරුවලට කරනු ලබන සියලු පත් කිරීම් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිට විය යුතුය. නියමිත දිනයට පෙර කරනු ලැබ, ඒ දිනයෙහි හෝ ඊට පසු ක්‍රියාත්මක වන සියලු උසස් කිරීම් කොමිෂන් සභාවේ අනුමතියට යටත් විය යුතු අතර නියමිත දිනයෙහි හෝ ඊට පසු කරන ලද පත් කිරීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිළිගනිමින් මේ වගන්තිය යටතේ කරනු ලබන සියලු තෝරා ගැනීම් අවලංගු නොකළ හැකි විය යුතු ය.

සේවය කරන නිලධරයන් පිළිබඳ පරීක්ෂණය හා අලුත් සේවා නියමයන් හා කොන්දේසි අදාළ කිරීම සීමා කිරීම.

17. (1) සේවකයකු දරන තනතුරු දැරීමට ඔහුගේ සමර්ථතාවය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් පරීක්ෂණයකින් හෝ අන් ආකාරයකින් කොමිෂන් සභාව සෑහීමට පත් කරන ලෙස කොමිෂන් සභාව විසින් එහි පරම අභිමතය අනුව යම් සේවකයකුට නියම කළ හැකි ය;

එසේ වවු ද නියම කරනු ලැබිය හැකි යම් වර්ගයක හෝ වර්ගවල සේවකයන්ට පමණක් මේ උපවගන්තියෙහි ඉහත දැක්වුණු විධිවිධාන අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන තනතුරක් දරන තැනැත්තා ඒ තනතුර දැරීමට තමාගේ සමර්ථතාවය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් කොමිෂන් සභාව සෑහීමට පත් කිරීමට

අපොහොසත් වන අවස්ථාවක කොමිෂන් සභාවේ මතය අනුව ඔහුගේ හැකියාවන්ට ගැළපෙන තනතුරක ඔහුගේ කැමැත්ත ඇතිව ඔහු යෙදීමට කොමිෂන් සභාව උත්සාහ කළ යුතු අතර, ඒ ප්‍රතියෝජනය සිද්ධ නොකෙරුණහොත්, එකල ඔහුට අදාළ වූ සේවා නියමයන් හා කොන්දේසි අනුව හෝ එවැනි නියමයන් නොපවත්නා අවස්ථාවක යුක්තිසහගත කල්දීමක් කිරීමෙන් පසු ඔහු සේවයේ සිටි සමුපකාර සමිතිය විසින් ඔහුගේ සේවය අවසන් කරන ලෙස කොමිෂන් සභාව විසින් එයි පරම අභිමතය අනුව නියම කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය අදාළ වන තනතුරක් දරන නැනැත්තා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිළිගැනීමට තෝරා ගන්නා අවස්ථාවක (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ඔහු විසින් කොමිෂන් සභාව සෑහීමට පත් කරනහොත් මිස හා එසේ කරන තුරු ඒ සේවා නියමයන්ට හා කොන්දේසිවලට ඔහුට හිමිකම් නොතිබිය යුතු ය.

18. යම් දිස්ත්‍රික්කයක සමුපකාර සමිතියක යම් තනතුරකට යටත් පිරිසෙයින් අවුරුදු දෙකක කාලයක්වත් ඒ දිස්ත්‍රික්කය ඇතුළත පදිංචිව නොසිටි කිසිම නැනැත්තකු පත් නොකළ යුතු ය: *පදිංචියේ සුදුසුකම.*

එසේ වුව ද කොමිෂන් සභාවේ මතය අනුව යම් දිස්ත්‍රික්කයක යම් සමුපකාර සමිතියක යම් තනතුරක් සඳහා සුදුසු අපේක්ෂකයකු ඒ දිස්ත්‍රික්කය තුළ නොමැති අවස්ථාවක ඒ දිස්ත්‍රික්කය තුළ අවුරුදු දෙකක කාලයක් පදිංචිව නොසිටි කෙනකු විය හැකි සුදුසු නැනැත්තකු පත් කිරීමෙන් ඒ තනතුරු පිරවීමට කොමිෂන් සභාව විසින් එම සමිතියට අවසර දිය හැකි ය.

19. සමුපකාර සමිතියක තනතුරකට පත් කරනු ලැබූ යම් නැනැත්තකුට ඒ සමිතියේ වර්ගය හා 20 (1) වන වගන්තිය යටතේ නියම කෙරෙන සේවකයන්ගේ ශ්‍රේණිය හෝ පංතිය අනුව ඒ තනතුරට අදාළ වැටුප් ක්‍රමය දිය යුතු ය. *සමුපකාර සමිතියක වර්ගය හා සේවකයන්ගේ ශ්‍රේණිය හෝ පංතිය අනුව සේවකයන්ගේ වැටුප් ක්‍රම නියම කළ යුතු බව.*

20. මේ පනතෙහි වෙන යම් විධිවිධානයක් නොතකා, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව හා අදාළ නැනැත්තාගේ හා සමුපකාර සමිතියේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් අනුමත කළ හැකි කාලයක් සඳහා හා නියමයන් හා කොන්දේසිවලට යටත්ව, යම් සමුපකාර සමිතියක යම් තනතුරකට ඒ කාර්යය සඳහා එම සමිතියේ සේවයට ද්විතීයකය කරන ලද ආණ්ඩුවේ සේවයේ යම් නැනැත්තකු, කොමිෂන් සභාව විසින් පත් කළ හැකි ය. *ආණ්ඩුවේ සේවකයන් ද්විතීයකය කිරීම.*

මේ වගන්තියේ කාර්යයන් සඳහා "අමාත්‍යවරයා" යන්නෙන් ඒ නැනැත්තා සේවයෙහි යොදවනු ලැබ සිටින ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයා අදහස් වේ.

21. සෑම සමුපකාර සමිතියක් විසින් එයි මුදල්වලින් එම සමිතියේ සේවකයන්ගේ වැටුප් ද වෙනත් දීමනා කිසිවක් වේනොත් ඒ දීමනා ද ගෙවිය යුතු ය. *සමුපකාර සමිතිවල සේවකයන්ගේ වැටුප්.*

සමුපකාර සමිතිවල සේවකයන් මාරු කිරීම.

22. (1) සමුපකාර සමිතියකට එම සමිතියේ යම් සේවකයකු ඒ සමිතියේ එක් සේවා ස්ථානයකින් එහි අන් කිසි සේවා ස්ථානයකට මාරු කිරීමේ බලය තිබිය යුතු අතර විනය හේතු නොවන යම් හේතුවක් නිසා මාරු කිරීම කරනු ලබන අවස්ථාවක ඒ මාරු කිරීම ඒ සේවකයාගේ පඩිනඩි කෙරෙහි හානිකරව බල නොපෑ යුතු ය.

(2) ඒ ඒ සේවායෝජකයාගේ එකඟත්වය කලින් ලබා ගෙන ඇතහොත් සමාන තත්ත්වයේ තනතුරු දරන සේවකයන් දෙදෙනකුගේ ඒකාබද්ධ ඉල්ලීම පිට එක් සමුපකාර සමිතියක යම් සේවකයකු වෙනත් සමුපකාර සමිතියක සේවකයකු විශයෙන් පසුව කී සමුපකාර සමිතියට මාරු කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුතු ය.

(ව)

සමුපකාර සමිතිවල සේවකයන් සේවයෙන් පහකිරීම හා වෙනත් දඬුවම් දීම.

23. (1) මේ පනතේ හෝ එය යටතේ සාදනු ලැබූ නියෝග කිසිවකින් විධිවිධාන අනුව හැර යම් සමුපකාර සමිතියක් විසින් ඒ සමුපකාර සමිතියේ කිසිම සේවකයකු සේවයෙන් පහ කිරීම හෝ අන් ආකාරයකින් ඔහුට දඬුවම් කිරීම නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ ඉහත දැක්වනු විධිවිධාන කිසිවකින්. නියමිත දිනයට පෙර සිදු වූ හෝ උද්ගත වූ යම් විෂමාචාරයක් හෝ විනය කඩ කිරීමක් හෝ වෙනත් පැමිණිලි නිමිත්තක් සම්බන්ධයෙන් යම් සමුපකාර සමිතියක සේවකයන්ගෙන් යම් කිසිවකුට විරුද්ධව එම විධිවිධාන අනුව ඒ සමුපකාර සමිතිය විසින් කාතාය ආරම්භ කිරීම හෝ හැකියාක් දුරට ඒ විධිවිධාන අනුව ඒ කාතාය පවත්වා ගෙන ගොස් අවසන් කිරීම අනිත්‍යකූල කෙරේ යයි සලකනු නොලැබිය යුතු ය.

සමුපකාර සමිති සේවකයන් තබන ඇප.

24. (1) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකට වැඩි මුදලක් ඇප වශයෙන් තබන ලෙස සමුපකාර සමිතියක් විසින් යම් සේවකයකුට නියම නොකළ යුතු ය.

(2) සමුපකාර සමිතියක යම් සේවකයකු විසින් තබන ලද මුදලින් වූ යම් ඇපයක් සමිතියේ නමින් බැංකුවක තැන්පත් කළ යුතු අතර එයට අයත් වන යම් පොලියක් ඒ සේවකයාට ගෙවිය යුතු ය.

සේවකයන්ට අදාළ නියෝග.

25. (1) පහත සඳහන් ආකාරයේ, එනම්—

(අ) සමුපකාර සමිතිවල සේවකයන් බඳවා ගැනීම, පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විසින් ඉල්ලා අස්වීම හා ඔවුන්ගේ සේවාවන් අවසාන කිරීම සම්බන්ධයෙන් ;

(ආ) ඒ සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කරමින් හා වැටුප් ක්‍රම, දීමනා හා පාරිතෝෂික ගෙවීම්, අත්තිකාරම් දීම, උසස් කිරීම, නිවාඩු, නිලධරයන්ගේ වැඩ තහනම් කිරීම, පත්වීම් අවසාන කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඒ සේවකයන්ට අන් කිසි ක්‍රමයක දඬුවම් පැමිණවීම හා ඊට විරුද්ධව යම් අභියාචනා කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වමින් ; හා

(ඇ) ඒ සේවකයන්ගේ සේවා නියමයන්ට හෝ කොන්දේසි වලට අදාළ, අවශ්‍ය යැයි සලකනු ලබන, වෙනත් කරුණු සම්බන්ධයෙන්

නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උප වගන්තියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් සාදනු ලබන සෑම නියෝගයක් ම පිළිපැදීමට සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් බැඳී සිටිය යුතු ය.

26. සෑම සමුපකාර සමිතියක් ම විසින්— සිය සේවකයන් සම්බන්ධයෙන් සමුපකාර සමිතිවල යුතුකම.

(අ) එහි සෑම සේවකයකු සම්බන්ධයෙන් නියම කරනු ලබන නාම ලේඛන හෝ සටහන් තබා පවත්වා ගෙන යා යුතු අතර ඒ එක් එක් සේවකයා සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි සියලු විස්තර එහි සටහන් කළ යුතු ය;

(ආ) එහි සේවකයන් සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි වාරවාර්තා හෝ වාර්තා, හෝ කොමිෂන් සභාවට අවශ්‍යවී සපයන ලෙස කලින් කල නියම කළ හැකි තොරතුරු කොමිෂන් සභාව වෙත සැපයිය යුතු ය; තව ද

(ඇ) සමිතියේ කාර්යාලවලින් යම් කාර්යාලයකට ඇතුළුවී, එහි තබාගෙන යනු ලබන පොත්, ගණන්, සටහන් හෝ වෙනත් ලේඛන කිසිවක් පරීක්ෂා කිරීමට හා ඒවායේ පිටපත් ගැනීමට බලය පවරනු ලැබූ කොමිෂන් සභාවේ යම් සේවකයකුට හෝ සාමාජිකයකුට එසේ කිරීමට ඉඩ දිය යුතු ය.

27. සේවායෝජකයකු වූ සෑම සමුපකාර සමිතියක් ම හා ඒ සමිතියේ සෑම සේවකයකු ම විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි යම් මුදලක් වාරපතා දායක මුදල් වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු ය. අර්ථසාධක අරමුදල.

28. සේවයට ගන්නා ලද්දේ නියමිත දිනයට පෙර වුව ද පසුව වුව ද සියලු සේවකයන් ඔවුන් සේවයට ගන්නා ලද්දේ යම් සමිතියක් විසින් ද ඒ සමිතියේ සේවකයන් බව, ඒ සමිතියේ සේවයෙහි නියුක්ත බව හා ඒ සමිතියට පක්ෂපාතවිය යුතු බව සැක දුරුවීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. සමුපකාර සේවකයන් කොමිෂන් සභාවේ නොව සමිතියේ සේවකයන් බව.

(1) (2)

## III වන කොටස

## කොමසාරිස්ගේ බලතල

29. (1) සමුපකාර සමිතිවල තනතුරු සඳහා වැටුප් ක්‍රම නියම කිරීමේ කාර්යය සඳහා එක් එක් සමුපකාර සමිතිය වර්ග කිරීමේ ද යම් සමුපකාර සමිතියක සේවකයන්ගේ ශ්‍රේණි හෝ පන්ති සහ ඒ එක් එක් ශ්‍රේණියේ හෝ පන්තියේ විය යුතු සේවකයන්ගේ ගණන නිශ්චය කිරීමේ ද තමා සුදුසු යයි සලකන අන්දමින් කලින් කල එය වෙනස් කිරීමේ ද බලය කොමසාරිස්ට තිබිය යුතු ය. කොමසාරිස් විසින් සමිති වර්ග කළ යුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්චය කළ යුතු බව.

(2) (1) වන උප වගන්තිය යටතේ කොමසාරිස් විසින් කරනු ලබන නිශ්චය කිරීම කඩකරමින් කිසිම සමූපකාර සමිතියක් විසින් කිසිම තැනැත්තකු සේවයට නොගත යුතු ය.

සුදුසුකම්, වැටුප් ක්‍රම ආදිය පිළිබඳව කොමිෂන් සභාව කොමසාරිස්ගේ එකඟත්වය ලබා ගත යුතු බව.

30. කොමිෂන් සභාව විසින්, සමූපකාර සමිතිවල යම් තනතුරකට පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම ද යම් පන්තියක හෝ යම් ශ්‍රේණියක යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළ යුතු වැටුප් ක්‍රම නියම කිරීම ද ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම ද කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව කළ යුතු ය.

## IV වන කොටස

## විවිධ විධිවිධාන

දුෂ්කරතා ඉවත් කිරීම.

31. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී මේ පනතේ කිසිම විධිවිධානයක් හෝ පූර්ණ විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවක් උද්ගත වුවහොත් අමාත්‍යවරයා විසින් ආඥාවක් මගින් ඒ සැකය හෝ දුෂ්කරතාව ඉවත් කළ හැකි ය; නොහොත් නිශ්චය කළ හැකි ය. එවැනි සෑම ආඥාවක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එසේ පළ කරනු ලැබීමෙන් පසු එයට නීතිමය බලය තිබිය යුතුවත් හැර මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් වලංගුව බලපැවැත්විය යුතු ය.

කොමිෂන් සභාව විසින් නියෝග සෑදිය හැකි බව.

32. (1) ප්‍රකාශිතවම අන් ආකාරයක විධිවිධාන සලස්වනු ලද්දේ නම් මිස, නියෝග සෑදීමට මේ පනත යටතේ බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් ද ඒ සියලු කරුණු සහ නියම කළ යුතු යයි මේ පනතින් ප්‍රකාශ කර හෝ නියම කර ඇති සියලු කරුණු සඳහා වූ නියෝග ඇතුළුව, මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි ප්‍රතිපත්ති ඵලගැන්වීම සඳහා අවශ්‍ය බව කොමිෂන් සභාවට පෙනී යා හැකි සියලු නියෝග කොමිෂන් සභාව විසින් සෑදිය හැකි ය,

(2) එවැනි කිසිම නියෝගයක්, අමාත්‍යවරයා විසින් එය අනුමත කරනු ලබන තුරු සහ ඒ අනුමතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තුරු බල නොපැවැත්විය යුතු ය.

(3) යම් නිවේදනයක් (2) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, ඒ නිවේදනය අදාළ වන නියෝගය, එය මෙහිලා සදනු ලැබුවාක් මෙන් වලංගුව බලපැවැත්විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ නිදහස.

33. කොමිෂන් සභාවේ සාමාජිකයකු [illegible] විසින් පවරා සාමාජිකයා වශයෙන් හෝ නීතිගත තත්ත්වයෙන් කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් තීරණයක් හෝ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා සාමාජිකයාට විරුද්ධ කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ සිවිල් හෝ අපරාධ අන් නීතිකෘත්‍යයක් පැවරීම හෝ පවත්වාගෙන යාම නො කළ යුතුය.

34. මෙම පනතේ විධිවිධාන ගැන නොතකා සමුපකාර සමිතියක් විසින් එහි කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයේ දියුණුව පිණිස— ගිවිසුම් මත, අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයන් සේවයෙහි යොදවා ගැනීම.

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමතිය ඇතිව ගිවිසුම් පදනමක් පිට යම් නියමිත කාලයකට ප්‍රවීණයකුගේ හෝ විශේෂඥයකුගේ සේවය ලබා ගත හැකි ය;

නැතහොත්

(ආ) අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයන්, හෝ කෑලි මිම්මේ පදනම පිට ගෙවන සේවකයන් සේවයෙහි යොදවා ගත හැකි ය:

එසේ වුවද කොමිෂන් සභාවේ එකඟත්වය නොමැතිව එවැනි සේවකයන්ට තනතුරේ කිසිම ස්ථිර තත්ත්වයක් නොදිය යුතු ය.

35. (1) (අ) මෙම පනතේ විධිවිධාන කඩ කරන; හෝ වැරදි

(ආ) කරන ලෙස කොමිෂන් සභාව නියම කරන යම් ක්‍රියාවක් හෝ මේ පනතේ කාර්යයන් සඳහා කොමිෂන් සභාව හෝ යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තකු සපයන ලෙස නියම කරන යම් තොරතුරක් සැපයීම හිතාමතාම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින; හෝ

(ඇ) හිතාමතාම අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන

යම් සමුපකාර සමිතියක් හෝ එහි යම් නිලධරයකු හෝ සේවකයකු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වරදක් කරන සෑම සමුපකාර සමිතියක්ම හෝ සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(3) මෙම පනත යටතේ වූ යම් වරදක් සමුපකාර සමිතියක් විසින් කරනු ලැබූ අවස්ථාවක ඒ සමිතියේ සෑම නිලධරයකුම ඒ වරද කර ඇත්තේ තම දැනුම නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි සියලු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කරනහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් සේවකයකු නැවත සේවයට ගැනීම නියම කරමින් කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ උපදෙස් කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පිළිබඳව සමුපකාර සමිතියක් වරදකරු කරනු ලැබූ විට ඒ සමුපකාර සමිතිය—

(i) (2) වන උපවගන්තිය යටතේ එයට නියම කරනු ලැබිය හැකි යම් දඬුවමකට අතිරේකව, ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ පැහැර හැරීම ඉදිරියටත් පවත්වා ගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පණහක දඩයක් ගෙවීමට; හා

(ii) ඒ එක් එක් දවසෙහි හා කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඒ සේවකයා නැවත සේවයට බඳවා ගත යුතුව තුබූ දින යෙන් ආරම්භව ඒ සමූපකාර සමිතිය වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වූ කාල පරිච්ඡේදයේ එක් එක් දව සෙහි ඒ සේවකයා සේවයේ සිටියේ නම්, ඔහුගේ සේවය අවසන් කරනු නොලැබ තිබිණි නම් ඔහුට හිමිකම් තිබුණු වැටුපෙහි හෝ වේතනයෙහි ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ පාරිශ්‍රමිකය ඒ සේවකයාට ගෙවීමට

යටත් විය යුතු ය.

සමූපකාර සමිතියක් මේ උපවගන්තියේ (ii) ඡේදය යටතේ ගෙවීමට යටත් වන යම් මුදලක් ඒ සමූපකාර සමිතිය වරදකරු කරනු ලැබූ අධිකරණය විසින් ඒ සමිතියට නියම කරනු ලැබූ දඩයක් ලෙස ඒ අධිකරණයේ ආඥාවක් පිට අයකර ගනු ලැබිය හැකි අතර එසේ අයකර ගන්නා මුදල ඒ සේවකයාට ගෙවිය යුතු ය.

කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම.

36. තම රාජකාරිය කිරීමෙහිදී හැර නියමින් හෝ අනියමින් තමා විසින්ම හෝ අන් තැනැත්තකු ගේ මාර්ගයෙන් කවර වූ හෝ ආකාරයකින් කොමිෂන් සභාවේ යම් තීරණයක් කෙරෙහි හෝ යම් සාමාජිකයකු කෙරෙහි බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා ඒ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

බලය නොමැතිව තොරතුරු එළිදරව් කිරීම තහනම් බව.

37. කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයකු, කොමිෂන් සභාවේ ලේකම්, කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ අන් කවර තැනැත්තකු විසින් වුව ද තම නිල කාර්යයන් කිරීමෙහි ලා නොවන අන් ආකාරයකින් තමාගේ රාජකාරි ඉටු කිරීමෙහි දී තමාට දැනගන්නට ලැබෙන කවර හෝ ලේඛනයක්, සන්දේශයක් හෝ තොරතුරක් පළ කිරීම හෝ අන් තැනැත්තකුට එළිදරව් කිරීම නොකළ යුතු ය.

කොමිෂන් සභාවේ සන්දේශ වරප්‍රසාද යුක්ත බව.

38. කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයකු හෝ නිලධරයකු හා යම් සමූපකාර සමිතියක් හෝ ඒ සමූපකාර සමිතියේ පාලක කාරක සභාවේ යම් සාමාජිකයකු හෝ එහි නිලධරයකු හා අතර හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හා අතර කොමිෂන් සභාවේ කාර්යයන් අතුරෙන් යම් කාර්යයක් කිරීමෙහිලා හෝ ඒ කාර්යය කිරීම සම්බන්ධයෙන් හුවමාරු වූ ලිඛිත හෝ වාචික යම් සන්දේශයක් යම් නීතිකෘත්‍යයක දී ඉදිරිපත් කරන ලෙස හෝ එළිදරව් කරන ලෙස, එසේ ඉදිරිපත් කිරීමට හෝ එළිදරව් කිරීමට සභාපති ලියවිල්ලකින් කැමැත්ත දෙතොත් මිස කිසිම තැනැත්තකුට අවසර නොදිය යුතු ය; නොහොත් බල නොකළ යුතු ය.

39. කොමිෂන් සභාවට හෝ එය සම්බන්ධයෙන් හෝ සේවා යෝජකයකු වශයෙන් යම් සමුපකාර සමිතියකට හෝ එය සම්බන්ධයෙන් හෝ යම් සමුපකාර සමිතියක සේවයෙහි නියුක්ත යම් සේවකයකු සම්බන්ධයෙන් හෝ කාර්මික ආරවුල් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය; නැතහොත් එසේ අදාළ වන ලෙස තේරුම් ගැනීම හෝ සැලකීම නොකළ යුතු ය: ඇතැම් ප්‍රඥප්ති සමුපකාර සමිතිවලට හා එවායේ සේවකයන්ට අදාළ නොවිය යුතු බව. 131 අධි.

එසේ වුව ද මේ වගන්තියේ ඉහත දක්වුණු විධිවිධාන කාර්මික ආරවුල් පනත යටතේ පත් කරන ලද කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ බේරුම්කරුවකු ඉදිරියෙහි නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි පැවති යම් කාර්මික ආරවුලක් කෙරෙහි බලපාන ලෙස නොසැලකිය යුතු ය.

40. පද සම්බන්ධයෙන් අනාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"කොමිෂන් සභාව" යන්නෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව අදහස් වේ;

"කොමසාරිස්" යන්නෙන් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් අදහස් වේ;

"සමුපකාර සමිතිය" යන්නෙන් සමුපකාර සමිතිවලට අදාළ නීතිය යටතේ ලියාපදිංචි කරන ලද සමිතියක් අදහස් වේ;

"දිස්ත්‍රික්කය" යන්නෙන් පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ පිහිටුවන ලද පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් වේ;

"සේවකයා" යන්නෙන් මෙම පනතේ අර්ථානුකූලව සමුපකාර සමිතියක සේවකයෙක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් අග්‍රාමාත්‍යවරයා විසින් සමුපකාර සංවර්ධන විෂය හෝ කාර්යය භාර කරනු ලැබ සිටින අමාත්‍යවරයා අදහස් වේ;

"නියම කරනු ලබන" යන්නෙන් කොමිෂන් සභාව විසින් සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ.

## උපලේඛනය

### (10 වන වගන්තිය)

**කොමිෂන් සභාවේ සාමාජිකයාගේ ප්‍රතිඥාව**

සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජිකයකු ලෙස පත් කරනු ලැබ සිටින ............................................................ වන මම, සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික ධුරයෙහි කාර්යයන් භයක් හෝ පක්ෂ භජනයක් හෝ දයාවක් හෝ ද්වේෂයක් නොමැතිව ඉටු කරන බව හා ඒ කාර්යයන්ට අදාළ කිසිදු කරුණක් මට අයත් රාජකාරි ඉටු කිරීමෙහි දී හැර අන් ලෙසකින් කිසිදු තැනැත්තකුට සෘජුව හෝ අනියමින් හෙළිදරව් නොකරන බවට දිවුරමි/ගාම්භීරතා පූර්වකව ද අවංකව ද ප්‍රතිඥා දෙමි.

19.............................. මස.............................. වන දින වූ මෙදින මා ඉදිරිපිට දී දිවුරන ලදී/ප්‍රතිඥා දෙන ලදී.

............................................................

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

### කොමිෂන් සභාවේ නිලධරයාගේ දිවුරුම හෝ ප්‍රතිඥාව

සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්ගේ/නිලධරයකුගේ කාර්යයන් ක්‍රියාවෙහි යෙදවීම ලෙස ඉල්ලනු ලැබ සිටින ..................................................................................................වන මම, සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධරයකු වශයෙන් වූ මගේ රාජකාරි ඉටු කිරීමේ දී මට දැනගන්නට ලැබිය හැකි කවර ආකාරයේ වූ හෝ ලේඛනයක, සංදේශයක හෝ තොරතුරක අන්තර්ගත කරුණු හෝ ඒ කරුණුවල කිසියම් කොටසක් කිසිම තැනැත්තකුට රාජකාරිය ඉටු කිරීමෙහි ලා හැර අන් ලෙසකින් කියමින් හෝ අනියමින් එළිදරව් නොකරන බවට දිවුරමි/ගම්භීරතා පූර්වකව ද අවංකව ද ප්‍රතිඥා දෙමි.

19............................මස................වන දින වූ මෙදින මා ඉදිරිපිට දී දිවුරන ලදී/ප්‍රතිඥා දෙන ලදී.

.............................................

සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති.